**ශීර්ෂය 267- මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 267 - මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර එ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ එවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපළ, පිරියත සහ උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2023 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත සහ උපකරණවල වටිනාකම්වල එකතුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව රු.1,383,024,529ක් ලෙසත් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එම වටිනාකම රු.1,378,575,634ක් ලෙසත් දැක්වීමෙන් රු.4,448,895ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂවල මෙම විචලනයන් වැලැක්වීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාණ්ඩාගාර පොත් සමග සැසඳීමට පියවර ගත යුතුය. |
| (ii) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය ප්‍රකාරව මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් රු.22,280,648ක් ලෙසත් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එම වටිනාකම රු.22,537,817ක් ලෙසත් දැක්වීමෙන් රු.257,169ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | 2024 වර්ෂයේ මෙම වෙනස නිවැරදි ලබන බව. | - එම - |
| (iii) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය ප්‍රකාරව මූලධන වත්කම් මිලදී ගැනීම රු.6,563,160ක් ලෙසත් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එම ශේෂය රු.6,163,840ක් ලෙසත් දැක්වීමෙන් රු.399,320ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | Zip file ක්‍රමයේදී සිදුවූ තාක්ෂණික අඩුපාඩුව නිසා මෙම වෙනස පැවැති බව. | - එම - |

**(ආ) අග්‍රිම ශේෂ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය විසින් 2023 දෙසැම්බර් 29 දින තැන්පත් කර තිබූ රු.8,000,000ක අග්‍රිම ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මුදල් හා මුදල්වලට සමාන දෑ ලෙස නොදක්වා මුළුමනින්ම අත්හැරී තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් පියවීමේදි ඇතුළත් නොකළ බව. | උපයෝජනය නොකළ තැන්පතු ශේෂ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020/2021 කාලපරිච්ඡේදයේ කොවිඩ් වසංගතය පැවති කාල සීමාවේ විශේෂ ප්‍රතිලාභ ගෙවීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබූ මුදලින් ප්‍රතිලාභීන්ට නොගෙවා ඉතිරිව තිබූ රු.579,500ක් නැවත එම දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය නොකර පුදුකුඩියිරුප්පු ප්‍රජා බැංකුවේ රඳවාගෙන තිබුණි. | ආපසු ප්‍රතිපූර්ණය කිරිමට පියවර ගෙන ඇති බව. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට නැවත ප්‍රතිපූර්ණය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සමෘද්ධි සමාජ පදනම් බැංකු 03ක් විසින් 2014 සිට 2022 දක්වා කාලපරිච්ඡේදයේ ප්‍රතිලාභීන් 31කට ලබාදුන් ණයවලින් එකතුව රු.1,421,364ක හිඟහිටි ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට පැවතුණි. | සමෘද්ධි සංවර්ධන නිලධාරීන් මාර්ගයෙන් ණය අයකර ගැනිමට පියවර ගනු ලබන බව. | හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට සුදුසු පියවර ගත යුතුය. |
| (ඇ) | සමෘද්ධි සමාජ පදනම් බැංකුවල පැවැති ගිණුම් වර්ග 05ක ප්‍රතිලාභීන් 6,172කගේ එකතුව රු.26,299,722ක අක්‍රිය බැංකු ගිණුම් ශේෂ පිළිබඳව සමාලෝචිත වර්ෂය අවසානයටත් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙවැනි ගිණුම්වල සංඛ්‍යාව අඩුකරමින් පවතින බව. | සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම් සක්‍රීය කිරීමට විධිමත් පියවර ගත යුතුය. |

### 2.2 අත්තිකාරම් ගෙවීම සහ නිරවුල් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවීන්ගෙන් වී මිලදීගෙන විකිණීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කිසිදු ගිවිසුමකින් තොරව විවිධ සේවා සමුපකාර සමිති දෙකක් වෙත 2015 වර්ෂයේ ලබාදුන් එකතුව රු.20,729,785ක අත්තිකාරම් මුදලින් එකතුව රු.14,259,125ක් හෙවත් සියයට 69ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නිරවුල් කර නොතිබුණි. | පනංගාමම්පත්තු වි.සේ.ස. සමිති ශේෂය රු.1,909,125ක් ලෙසත්, විසුවාමඩු වි.සේ.ස. සමිති ශේෂය රු.12,350,000ක් ලෙසත්, තවදුරටත් අයවිය යුතුය පවතින බව. | අයවිය යුතු අත්තිකාරම් මුදල් ආපසු ලබා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ ග්‍රාමීය නිවාස, ඉදිකිරීම් කර්මාන්ත සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් කොටස් වශයෙන් දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 98කට ලබාදුන් නිවාස යෝජනා ව්‍යාපෘති සඳහා වූ ගෙවීමට නියමිත මුදල් රු.13,405,280ක් අදාල ප්‍රතිලාභීන්ට ලබානොදී පුදුකුඩියිරුප්පු, ඔඩ්ඩුසුඩාන්, උඩෙයාර්කට්ටු සමෘද්ධි බැංකු ගිණුම්වල වර්ෂ 01 ක සිට වර්ෂ 04ක් දක්වා කාල පරාසයක් අදාල අරමුණු සඳහා උපයෝජනය නොකර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් රඳවාගෙන තිබුණි. | අදාල බලධාරීන්ගේ අනුමැතිය ලැබූ වහාම ගෙවීම් සිදුකිරිමට කටයුතු කරන බව | සමෘද්ධි බැංකු ගිණුම්වල ඇති එම මුදල් අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට සුදුසු පියවර ගත යුතුය. |
| (ආ) | දිස්ත්‍රික්කයේ සමෘද්ධි ජීවනෝපාය සහනාධාර සම්බන්ධ ප්‍රතිලාභීන්ගේ ගිණුම් නියැදි විගණන පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් 135කගේ ගිණුම්වලට බැර කර ඇති රු.32,106 සිට රු.175,749ක් දක්වා පරාසයකින් සැදුම්ලත් එකතුව රු.8,443,715ක සහනාධාර මුදල් ජීවනෝපාය ඉහළ නැංවීමේ අරමුණු සඳහා උපයෝජනය නොකර සමෘද්ධි බැංකු ගිණුම්වල නිෂ්කාර්යව පැවැතුණි. | ඉහත ප්‍රතිලාභීන්ගේ විස්තර ලබාගෙන ක්ෂේත්‍ර නිලධාරීන් මාර්ගයෙන් ප්‍රතිලාභීන් හඳුනාගෙන ගෙවීම් සිදුකරමින් පවතින බව. | ප්‍රතිලාභීන් සම්බන්ධව විමර්ශනය කර ජීවනෝපාය ගෙවීම් අදාල අරමුණු සඳහා උපයෝගි කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේදී තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරි කමිටුව විසින් තීරණය කර තිබූ තක්සේරු වටිනාකමට අනුව රජයේ ඉඩම් 19ක් වෙනුවෙන් අයකළ යුතු එකතුව රු.3,268,790ක බදුගාස්තු පසුගිය වර්ෂ 01 ක සිට වර්ෂ 05ක් දක්වා අයකර නොතිබුණි. එසේම, 2019 වර්ෂයට පෙර කාල පරිච්ඡේදයේ සිට එම රජයේ ඉඩම් සලකුණු කිරීමට පියවර නොගැනීමෙන් එම ඉඩම් පරිහරණය කළ විවිධ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු බදු ආදායම් අහිමි වී තිබුණි. | ඇතැම් අය ගාස්තු ගෙවා තිබුණි. තවද, ඇතැම් අයට ලිපි මගින් දැනුම් දී ඇත. 2019 වර්ෂයට පෙර කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බව | හිඟහිටි බදුගාස්තු අයකර ගැනිමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | තුනුක්කායි ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ප්‍රතිලාභියෙකුට තාවකාලික බදු පදනමින් 2014 වර්ෂයේ ලබාදුන් අක්කර 29ක රජයේ ඉඩමට අදාල බදු ගාස්තු එකතුව රු.1,480,000ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් අයකර නොතිබුණි. | ඉඩම් කොමසාරිස් ජනරාල් වරයාට යවා ඇත. උපදෙස් ලැබූ වහාම නියමිත ආදායම් අයකිරීමට පියවර ගනු ලබන බව. | -එම- |

## 3.3 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර දැනුම්දීමකින් තොරව රාජකාරියට වාර්තා නොකළ සමෘද්ධි සංවර්ධන නිලධාරින් 04කුට සහ ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කළ සේවකයෙකුටත් ඔවුන් සේවයට වාර්තා නොකළ කාලපරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු.712,675ක් වැඩිපුර වැටුප් ගෙවා තිබුණි. | ප්‍රාදේශීය ලේකම් මාර්ගයෙන් මුදල් ආපසු අයකර ගැනීමට පියවර ගෙන ඇත. අපොහොසත් වුවහොත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බවත් දැනුම් දී ඇති බව. | වැටුප් ආපසු අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර, එම නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | කරෙයිතුරෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා ශාඛාව විසින් 2022 සහ 2023 වර්ෂවල ආබාධිත අය සඳහා දීමනා, වකුගඩු රෝග දීමනා, වයස 70න් ඉහළ හා වයස 100න් ඉහළ වැඩිහිටි දීමනා ලබාදෙමින් සිටි ප්‍රතිලාභීන් 154ට සමාලෝචිත වර්ෂය අවසානය වනවිට එකතුව රු.2,788,300ක් දීමනා මුදල් ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය විය. | මුදල් ලබාගෙන දීමනා සිදුකරිමට අඛණ්ඩව කටයුතු කරමින් පවතින බව. | නියමිත කාලවකවානු තුළ ප්‍රතිලාභීන්ට හිමිවිය යුතු දීමනා ගෙවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව, තිරසාර සංවර්ධන අරමුණු 2030 වර්ෂයේ ළඟාකර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂිකව සපුරාගත යුතු ඉලක්ක, එම ඉලක්ක ළඟා කර ගැනිමට ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය මැනීම සඳහා දර්ශක සකස් කිරීමට පනත සම්මත වී වර්ෂ 6 ක් යනතුරුත් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගෙන ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කිරීමෙන් වාර්ෂිකව එහි ප්‍රගතිය මැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය. |

## 5. යහපාලනය

### 5.1 මහජනතාවට සේවාවන් ඉටුකිරිම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඇති විවිධ සේවාවන් සපයන මධ්‍යස්ථාන හා අංශ පහසුවෙන් මහජනතාවට හඳුනාගෙන එවැනි සේවාවන් ලබාගත හැකි වන පරිදි ප්‍රධාන ඇතුල් වීමේ ස්ථානයේ හා අනෙකුත් පිවිසුම් ස්ථානවල කාර්යාල පරිශ්‍ර පිහිටීමේ සැලැස්ම නියමිත ආකාරයෙන් ප්‍රදර්ශනය කිරීමට කටයුතු නොකිරීමෙන් සේවාලාභීන් අදාල සේවා ලබාගන්නා ස්ථාන හඳුනාගැනීමේදි විවිධ දුෂ්කරතාවයන්ට මුහුණදි තිබූ බව නිරීක්ෂණය විය. | කඩිනමින් කාර්යාල පිහිටීමේ සැලැස්ම, කාර්යාල ඉදිරිපස ස්ථාපිත කිරීමට පියවර ගනු ලබන බව. | සේවාලාභීන්ට පහසුව සඳහා කාර්යාල පිහිටීමේ සැලැස්ම, ප්‍රදර්ශනය කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉන්ජිනේරු තනතුර සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරු 03, ගණකාධිකාරින් තනතුරු 02ක් සහ පරිපාලන නිලධාරීන් 05කගේ කාර්ය මණ්ඩල පුරප්පාඩු වර්ෂ 01 ක සිට වර්ෂ 10ක් දක්වා පවතින බව නිරීක්ෂණය විය. | පත්වීම් ලබාදුන් පසුව පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමට නියමිත බව. | විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පිරවීමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ආ) | තාක්ෂණික සහකාර නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථානමාරු සිදුනොකිරීම නිසා දිස්ත්‍රික්කය තුළ එවැනි නිලධාරීන් 06ක් වර්ෂ 05 ක සිට වර්ෂ 09ක් දක්වා කාලයක් එකම ස්ථානයක සේවයේ නිරතවී තිබුණ අතර, සමාලෝචිත වර්ෂයේ ස්ථානමාරු අයදුම්පත් කැඳවා තිබුණද, එයද ක්‍රියාත්මක වී නොතිබුණි. | තාක්ෂණික සහකාර නිලධාරීන්ගේ ස්ථානමාරු පිළිබඳ වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීමේ අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත ලිපියක් යවා ඇත. අනුමැතිය ලද විගස ස්ථානමාරු සිදුකරන බව. | ස්ථානමාරු ප්‍රතිපත්තිය ප්‍රකාරව වාර්ෂික ස්ථානමාරුවීම් සිදු කළ යුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ 2023 ජූලි 19 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් ගණකාධිකාරි ලෙස වැඩබැලීම් සිදු කරමින් සිටි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගණකාධිකාරිවරයාට වැඩබැලීමේ රාජකාරි ඉටුකිරිමට මේ දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී නොතිබුණ බව නිරීක්ෂණය විය. | අනුමැතිය ලබාගැනීමට පියවර ගෙන ඇති බව. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනිමට සුදුසු කටයුතු සිදුකළ යුතුය. |
| (ඈ) | වැලිඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් ලෙස රාජකාරි ඉටුකරන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ - I ශ්‍රේණියට අයත් නිලධාරියෙකු වර්ෂ 10කට අධික කාලයක් ස්ථානමාරු නොකර එකම සේවා ස්ථානයේ රාජකාරි කිරීමට අවස්ථාව ලබා දී තිබුණ බව නිරීක්ෂණය විය. | ස්ථානමාරු කිරීම අනුමැතිය සඳහා අමාත්‍යාංශයට යැවූ නමුත් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බව. | ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා වන ස්ථානමාරු ක්‍රමවේදය ප්‍රකාරව වාර්ෂික ස්ථානමාරුවලට අදාල කටයුතු සිදුකළ යුතුය. |